# ජාතිකත්වය ජයගැනීම

මේ ලිපිය ලියන්නේ පාර්ලිමේන්තු මැතිවරණයට කලින් එහෙත් එ ජ නි ස විශිෂ්ට ජයක් ලබන්නේය යන විශ්වාසයෙනි. මැතිවරණයෙන් එ ජ නි ස ජය නොලබන බව ප්‍රකාශ කර සිටියේ තිස්ස අත්තනායක වැනි කිහිප දෙනකු පමණ ය. ඔහු එසේ විශ්වාස කෙළේ දැයි අපි නො දනිමු. එසේ විශ්වාස කෙළේ නම් අපට කළ හැක්කේ ඔහුට අනුකම්පා කිරීම පමණකි. එහෙත් ඒ අනුකම්පාවෙන් ඔහුට වැඩක් නොවන බව ද අපි දනිමු. රනිල් වික්‍රමසිංහ නම් එ ජා පෙ පරදින බව කල් ඇතිව ම දැනගන්නට ඇත්තේ ඔහුට ඒ පිළිබඳ අත්දැකීම් සම්භාරයක් ඇති බැවිනි. ජ වි පෙරමුණට වැලේ වැල් නැතිව පරාජය හිමිවීම හැරෙන්නට වෙනත් ඉරණමක් නොමැති බවත් ඒ පක්ෂය හා පක්ෂය වැඩකරන රටාව වූයේ තම න්‍යාය පත්‍රයට අනුව අන් අය කඩේ යවා තම පාක්ෂිකයන් ඉදිරියට ගැනීම බවත් සරත් ෆොන්සේකා හා අනෝමා ෆොන්සේකා නොදැන සිටියේ නම් ඒ ගැන ද අපට කිවහැක්කේ බිලේක්ලා හා මිලිබෑන්ඩ්ලා කියන ආකාරයට වැඩකර ලබාගත් ඡන්ද ප්‍රතිඵලය ගැන "නුඹ නාඬන් අමල් බිසෝ" යන්න පමණකි.

අද සිංහල ජනතාව අතර ජාතිකත්ව ප්‍රබෝධය වැඩි වී ඇත. ඒ පනස්හයේ තිබූ ජාතික ප්‍රබෝධයටත් වැඩි ය. කෙටියෙන් කිවහොත් අද මෙරට ප්‍රධාන මතවාදය වී ඇත්තේ ජාතික මතවාදය ය. පසුගිය සියවසේ ම එවැනි තත්වයක් නො වීය. එදා ම එ පෙ ජයගත්තේ ජාතිකත්ව හැඟීම් කාලයකට පසුව මතුපිටට පැමිණීම හේතුකොටගෙන ය. යටත්විජිත සමයේ සිංහලයන්ගේ විශේෂයෙන් ම සිංහල බෞද්ධයන්ගේ නැතිවී ගිය අයිතිවාසිකම් දිනාගැනීමට වූ අවශ්‍යතාව අනගාරික ධර්මපාලතුමාගේ යුගයෙන් පසුව පනස්හයේ නැවත වරක් ඉදිරියට පැමිණියේ ය. එහෙත් ඒ හැඟීමෙන් මිස බුද්ධියෙන් කරන ලද්දක් නො වී ය. එකල ජාතික බලවේගවලට ජාතික වූ මතවාද නො වී ය. එසේ වුවත් සිංහලයෝ සාමාන්‍යයෙන් හැඟීම් මත ඇතිකරගත් ජාතිකත්වයක් මුල් කරගෙන ඡන්දය දුන්හ.

එ ජා පක්ෂය පොදුවේ ගත්කල විජාතික බලවේගවල පක්ෂය වුවත් 1947 දී මාක්ස්වාදී පක්ෂ සමග සංසන්දනය කිරීමේ දී සේනනානයකලාගේ නායකත්වය හේතුවෙන් ඒ පක්ෂයට යම් ජාතිකත්වයක් ආරෝපණය වී තිබිණි. මාක්ස්වාදීහු ජාත්‍යන්තරවාදී යටත්විජිත විරෝධීහු වූහ. තිහේ දශකයේ සිට පනහේ දශකය දක්වා යම් ජාතිකත්වයක් තිබූ ගිහි පැවිදි කිහිප දෙනකු මාක්ස්වාදී පක්ෂවලට ආකර්ෂණය වී නම් ඒ එම පක්ෂවල තිබූ යටත්විජිතවිරෝධය නිසා විය. 1951 දී පිහිටුවන ලද ශ්‍රී ල නි ප මුල දී ලිබරල්වාදී පක්ෂයක් වුවත් 1954 දී පමණ එය ජාතිකත්වයේ පක්ෂය බවට පත්විය. 1956 ද ඒ පක්ෂය පිලිප් ගුණවර්ධන මහතාගේ වි ල ස ස ප, දහනායක හා ර්රියගොල්ල මහත්වරුනේගේ පක්ෂ සමග එකතු වී ම එ පෙ පිහිටුවා ගත්තේ ය. 1959 න් පමණ පසුව පිලිප් ගුණවර්ධන මහතා ම එ පෙ නමින් වූ පක්ෂයේ නායකත්වයට පත් වූ අතර ශ්‍රී ල නි පක්ෂය ඒ නමින් ම කටයුතු කෙළේ ය.

1959 පමණ සිට 1991 පමණ දක්වා ද ශ්‍රී ල නි ප පැහැදිලි ව ජාතිකත්වයේ පක්ෂය ලෙස ක්‍රියා කෙළේ ය. මාක්ස්වාදී පක්ෂවලට තවදුරටත් ජාතිකවාදී පිරිස් ආකර්ෂණය කිරීමට නොහැකි වූ අතර ඒ පක්ෂවලට හුදෙක් තම පැවැත්ම සඳහා ම ශ්‍රි ල නි ප සමග සන්ධානගත වීමට සිදුවිය. එහෙත් එසේ කිරීමෙන් පසුව ද ඒ පක්ෂවලට වර්ධනයක් නැති විය. ඒ පක්ෂ පිරිහී ගියේ ශ්‍රි ල නි ප සමග සන්ධානවලට පිවිසීම නිසා යැයි ඇතැම් සුපිරි මාක්ස්වාදීහු පැවසූහ. එසේ පවසා ඔවුහු වෙනත් පක්ෂ පිහිටුවා ගත්හ. එහෙත් ඔවුන්ට කළ හැකි වූයේ වැඩිම වුවහොත් පළාත් සභා ආසනයක් දෙකක් දිනාගැනීම පමණ ය. ශ්‍රී ල නි ප සමග පෙරමුණකට නොඑළඹීම නිසා ඔවුන්ට සිදු වී ඇති සෙතක් නැත. ඔවුන් තවමත් සිටින්නේ පැරණි මාක්ස්වාදී පක්ෂ පිටුපසින් ය. මාක්ස්වාදී පක්ෂ පිළිගත යුතු කරුණක් නම් මාක්ස්වාදයෙන් තොර යටත්විජිත විරෝධී අරගල තිබෙන බවත් මේ යුගයේ යටත්විජිත විරෝධී අරගලය ජාතිකත්වය සමග බද්ධවී ඇති බවත් ජාතිකත්වය යටත්විජිත විරෝධී අරගලය සමග බද්ධ වී ඇති බවත් ය.

1956න් පසුව මෙරට පැවති මැතිවරණවලින් 1960 ජුලි, 1965, 1970, 1977 මැතිවරණ යම් ජාතිකත්වයක් මත පදනම් වී ජයග්‍රහණ කළ මැතිවරණ විය. එ ජා ප ජයග්‍රහණය කළ 1965 සහ 1977 වුව ද පිළිවෙළින් ඩඩ්ලි සේනනානායක මහතාගේ පෞද්ගලික වූ ජාතිකත්ව නායකත්වයකින් හා ජේ ආර් ජයවර්ධනගේ ධර්මිෂ්ට සංකල්පය පෙරදැරි කරගෙන සටන්කළ මැතිවරණ විය. ඩඩ්ලි සේනනානායක මහතාගේ ආණ්ඩුවේ පිලිප් ගුණවර්ධන මහතා ජාතිකත්ව වැඩ පිළිවෙළකට එකඟ වී කටයුතු කෙළේ ය. ඒ ආණ්ඩුවෙන් පෝය නිවාඩුව ඇති කෙරුණු අතර කෘෂිකර්මය නගා සිටුවීමට යම් පියවර ගැණිනි. ජේ ආර් ජයවර්ධනට ජාතිකත්වය අවශ්‍ය වූයේ

© Prof. Nalin De Silva

බලයට පැමිණීම සඳහා පමණකි. බලයට පැමිණි දා සිට ඔහු ජාතිකත්වයට එරෙහිව ක්‍රියා කෙළේ ය. ඒ පිළිබඳ විස්තර අවශ්‍ය නො වේ. ඔහු වචනයේ පරිසමාප්තාර්ථයෙන් ම යැංකි ඩිකී විය. රට ඇමරිකන්කරණයකට ලක්විය. එක් අතකින් ඒ වන විට ඇමරිකාව එංගලන්තය පරදවා ලෝක ආධිපත්‍යයට පත් වී සිටියේ ය. අනෙක් පැත්තෙන් ජේ ආර් ඇමරිකන් ගැත්තා විය. අද මෙරට ඇති වී තිබෙන පාදඩ සංස්කෘතියට හා විජාතික මානසිකත්වයට ප්‍රධාන වශයෙන් ම වගකිවයුත්තේ ඔහු ය. කසිකබල් විද්‍යුත් ජනමාධ්‍යවලට දොර විවෘත කළ ඔහු අවුරුදු තුන්සීයකට මෙරට පාසල් ඔස්සේ ලන්දේසීන්ට හා ඉංගිරිසින්ට කළ නොහැකි වූ සංස්කෘතික සෝදා පාළුවකට මග පෑදී ය. දේශපාලන වශයෙන් බටහිර ගැති ප්‍රතිපත්ති අනුගමනය කළ ඔහු හැත්තෑ හතේ පරම්පරාවක් පනස්හයේ දරුවනට එරෙහිව නිර්මාණය කෙළේ ය. මෙහි වඩාත්ම සරදම වූයේ හැත්තෑ හතේ පරම්පරාව පනස්හයේ දරුවන්ගේ ජෛවීය දරුවන් වීම ය.

එසේ පනස්හයේ දරුවන්ගේ ජෛවීය දරුවන් මගින් ම හැත්තෑහතේ පරම්පරාවක් බිහිකර ගැනීමට හැකිවූයේ පනස්හයට පදනම් වූ දර්ශනයක් මතවාද ප්‍රවාද සංකල්ප ආදිය නො වීම හේතුවෙනි. හැත්තෑහතෙන් පසුව ශ්‍රී ල නි පක්ෂ නායකත්වය පවා ජාතිකත්ව පදනමකින් ඉවතට ගැනීමට බටහිරයන්ට හැකිවිය. ශ්‍රී ල නි ප ඇතැම් නායකයෝ දශකයකට වැඩි කාලයක් තමන්ට බලයට පත්වීමට නොහැකි වූයේ ජාතිකවාදී ප්‍රතිපත්ති අනුගමනය කළ නිසා බව කියවන්නට පටන් ගත්හ. විජය කුමාරතුංගගේ මහජන පක්ෂය ඒ සම්බන්ධයෙන් විජාතික බලවේගවලට අවශ්‍ය ආකාරයට ක්‍රියා කෙළේ ය. එයට කලින් කුමාර් රූපසිංහගේ ජනවේගය ශ්‍රී ල නි ප විජාතික බලවේගවලට යටකිරීමට උත්සාහ කෙළේ ය. එහෙත් ඔහු අසාර්ථක වූයේ එකල ඒ සඳහා සමාජ පදනමක් නොතිබූ බැවිනි. විජය කුමාරතුංගට ජේ ආර් නිර්මාණය කළ සමාජය ශ්‍රී ල නි ප නොමග යැවීමට ආධාර විය. බණ්ඩාරනායක මහත්ම මහත්මීන්ගේ බැණාවරුන් දෙදෙනා ලවා ශ්‍රී ල නි ප විජාතිකත්වයට ගැනීමට උත්සාහ කිරීම බටහිරයන්ගේ උපක්‍රමයක් විය. කෙසේ වෙතත් චන්ද්‍රිකා කුමාරතුංග අනූවේ දශකයේ මුල ලංකාවට ගෙනෙනු ලැබුයේ විජාතික බලවේග විසිනි. ඇයට හිමි වූ කොන්ත්‍රාත්තුව වූයේ මෙරට තව තවත් බටහිරකරණයට ලක්කිරීමත් සහසන්ධීය රාජ්‍යයක් පිහිටුවා දෙමළ ජාතිවාදයට සිංහලයන් යටකර සිංහලයන්ගේ ඉතිරි අයිතිවාසිකම් ද නැතිකිරීම ය.

එහෙත් චන්ද්‍රිකාට තම කොන්ත්‍රාත්තුව ඉටුකර ජයග්‍රහණය කිරීමට නොහැකි විය. ශ්‍රී ල නි පක්ෂයෙහි මංගල සමරවීර, ජනවේග හා මහජන පක්ෂ කල්ලි ක්‍රියාත්මක වෙද්දී පක්ෂය තුළ හා පිටත ජාතිකවාදී කණ්ඩායම් පෙළ ගැසෙන්නට විය. 1986 අග ගුණදාස අමරසේකර මහතා ජාතික චින්තනයක් ගැන රත්නපුරේ පැවති සම්මන්ත්‍රණයක දී සඳහන් කෙළේ ය. එයට මාස දෙක තුනකට කලින් මගේ ලෝකය කෘතියෙන් බටහිර දැනුමේ ආධිපත්‍යය පිළිබඳ බුද්ධිමය සාකච්ඡාවක් ආරම්භ කර තිබුණි. අද බටහිර යටත්විජිතවාදය ක්‍රියාත්මක වනුයේ මූලික වශයෙන් ම සංස්කෘතික හා දැනුම් ආධිපත්‍යයක් මත පදනම් වී ය. බටහිර විද්‍යාව, විශේෂයෙන් ම බටහිර තාක්ෂණය යටත්විජිතවාදයෙහි ප්‍රධාන ම ආයුධ බවට පත් වී ඇත. පිළිවෙළින් හැඟිම් හා බුද්ධිය මත පදනම් වූ ජාතික චින්තන හා මගේ ලෝකය (චින්තන) ව්‍යාපෘති දෙක රත්නපුරේ පැවති සම්මන්ත්‍රණයේ දී ම එකක් බවට පත්වූයේ ජාතික චින්තනය යන නමින් ම ය. ඒ බද්ධ වූ ව්‍යාපාරයෙහි බලපෑම මුලින් ම එල්ල වූයේ විය යුතු පරිද්දෙන් ම ශ්‍රී ල නි පක්ෂයට ය. ඉන් පසු ජ වි පෙ සාමාජිකයන් ව සිටි විශ්වවිද්‍යාලයීය තරුණ පිරිසක් හා එයට ටික කලකට පෙර ජ වි පෙ ට ආකර්ෂණය වෙමින් සිටි කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් පිරිසක් ද ජාතික චින්තනයට ඇදී ආවෝ ය. ඒ අතරින් පිරිසක් ජනතා මිතුරෝ සංවිධානය පිහිටුවා ගත්හ. ඔවුහු ටික කලකින් ම මංගල සමරවීර සමග රටවැසි පෙරමුණක් පිහිටුවා 1994 මැතිවරණයේ දී චන්ද්‍රිකා සමරවීර කල්ලිය බලයට පත්කිරීමට කටයුතු කළහ. එහෙත් 1995 පැකේජයත් සමග ඔවුහු නැවතත් ජාතික මතවාදවලට පැමිණියහ. මාක්ස්වාදය හා ජාතිකත්වය අතර දෝලනය වූ ජ වි පෙට ද අනූවේ දශකය අවසාන වන විට ජාතික චින්තනය බල පෑවේ ය. ජ වි පෙරමුණ සමන්විත වූයේ අයාලේ ගිය පනස්හයේ දරුවන්ගෙනි. අනූවේ දශකය අග ජාතික මතවාදවලට පැමිණි ඔවුහු අද ඒ මතවාද පමණක් නොව මාක්ස්වාදය ද අතහැර විජාතික ඇමරිකන් ගැති දේශපාලනයක යෙදී සිටිති. ඔවුන් අද පෙනී සිටින්නේ බිලේක්ලා හා මිලිබෑන්ඩ්ලා වෙනුවෙනි. අද ඔවුන් අයාලේ ගිය පනස්හයේ දරුවන් ලෙස වුව ද හැඳින්විය නො හැකි ය. ඔවුන් වැඩිකල් නොගොස් ම දෙමළ ජාතික සන්ධානය වෙනුවෙන් ද පෙනී සිටිනු ඇත. එහෙත් ජනතාව ඔවුන් පරදවා මහින්ද රාජපක්ෂ මහතාගේ නායකත්වයෙන් ඇති ජාතිකත්වයට විශිෂ්ට ජයග්‍රහණයක් ලබා දී ඇත. (මතු සම්බන්ධයි)

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva